**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වෙබ් අඩවිය හා සොබා පුවත් හසුනේ පළකිරීම සඳහා 2017 ජුලි මස 01 වෙනිදා සිට සැප්තැම්බර් මස 30 දක්වා ජෛවවිවිධත්ව අංශය මගින් සිදුකරන ලද කාර්යයන්**

**1) පුරාජෛවවිවිධත්වය සංරක්ෂණය හා ආරක්ෂණය පිළිබඳ රාජ්‍ය නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව**

2017 ඔක්තෝම්බර් මස 03 වන දින අංක 416/C/1 ,සොබාදම්පියස, රොබට් ගුණවර්ධන මාවත, ,බත්තරමුල්ලෙහි පිහිටි මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ නව ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරයේදී පුරාජෛවවිවිධත්වය සංරක්ෂණය හා ආරක්ෂණය පිළිබඳ රාජ්‍ය නිළධාරීන් දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුවක් පවත්වන ලදී.

පුරාජෛවවිවිධත්වය විෂය වර්තමානයේ අලුත් විෂයක් ලෙසින් හඳුන්වාදී ඇති බැවින් විද්වතුන් අතර පවා එම විෂය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැත. එබැවින් පුරාජෛවවිවිධත්වය හා සම්බන්ධ වගකිවයුතු ආයතන වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල , වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව , වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව , වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය හා අනෙකුත් රාජ්‍ය ආයතන නිළධාරින් දැනුවත් කිරීමට සම්බන්ධ කරමින් මෙම වැඩමුළුව පවත්වන ලදි .

මෙම වැඩමුළුවේදී වියළි කලාපීය පුරාජෛවවිවිධත්වය පිළිබඳ දේශනයක් . පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලාපීය‍යේ පුරාවිද්‍යා අංශයේ මහාචාර්ය ආර්.එම්. එම්.චන්ද්‍රරත්න මහතා විසින්ද තෙත්කලාපීය පුරාජෛවවිවිධත්වය පිළිබඳ දේශනය කැළණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කැළුම් මනමේන්ද්‍ර ආරච්චි මහතා විසින්ද පුරා ජෛවවිවිධත්වය සංරක්ෂණය සහ ආරක්ෂණය පිළිබඳ දේශනයක් කැළණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මහාචාර්ය ගාමිණී අදිකාරි මහතා විසින්ද පවත්වන ලදී.

**2) ජාතික ජෛවවිවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව**

ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය විසින් 2016 වසරේදී ශ්‍රී ලංකාවේ ජෛවිවිධත්ව සංරක්ෂණය සඳහා ගෝලීය ඉලක්ක 20ක් (අයිචි) හා තිරසාර සංවර්ධන අරමුණු 17 පෙරදැරි කරගෙන ජාතික ඉලක්ක 12ක් යටතේ ජාතික ජෛවවිවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

ඒ පිළිබඳව රාජ්‍ය නිළධාරින් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2017.09.12 වන දින මහ බැංකු අධ්‍යයන කේන්ද්‍ර ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.මෙය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිසර ප්‍රතිපත්ති සහ සැලසුම්) ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

**3) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පරාගවාහකයින්ගේ වැදගත්කම හා ඔවුන් සංරක්ෂණය කිරීම පිළිබඳ වැඩමුළුව**

සපුෂ්ප ශාක විශේෂ වල ඵල දැරීම සඳහා වැදගත්වන පරාගණ ක්‍රියාවලිය සඳහා සක්‍රීයව දායකත්වය ලබාදෙනුයේ පරාගවාහකයන් වන මීමැස්සන්,බඹරුන් සමනළයින් හා සළඹයන් විසිනි. වර්තමානයේ විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසර පද්ධතිවලින් පරාග වාහකයින් වඳවී යනු දැකිය හැකිය. එබැවින් පරාගවාහකයින්ගේ වැදගත්කම හා ඔවුන් සංරක්ෂණය කිරීම පිළිබඳව කැළණිය විශ්ව විද්‍යාලයේ සිසු සිසුවියන් උදෙසා 2017 සැප්තැම්බර් 27වන දින වැඩමුළුවක් සංවිධානය කරන ලදි.




මෙහිදී දේශකවරුන් ලෙස කැලණිය විශ්ව විද්‍යාලයේ ,සත්ත්ව විද්‍යා අංශයේ මහාචාර්ය ශ්‍රියානි ඩයස් මහත්මිය හා ශාක විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය රත්නායක මහතා සම්පත්දායකත්වය ලබාදෙන ලදී.

### 4) ජාතික ජෛවවිවිධත්ව විද්වත් කමිටු රැස්වීම

ජෛවවවිධත්ව සංරක්ෂණය හා තිරසාර සංවර්ධනය උදෙසා තිරසාර භාවිතාව පිළිබඳ තීරණ ගැනීම සඳහා ජාතික ජෛවවිවිධත්ව විද්වත් කමිටුව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇත.

ජාතික ජෛවවවිධත්ව විද්වත් කමිටුව මගින් ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරි සැලැස්මේ විෂය ක්ෂේත්‍ර පිළිබඳ කරුණු රැසක් සාකච්ඡා කිරීම හා තීරණ ගැනීම සිදුකරනු ලබයි. කමිටුවේ සභාපති ආචාර්ය මැග්ඩන් ජයසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් 2017 සැප්තැම්බර් 22 වන දින මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ රැස්වීම් ශාලාවේදී කමිටු රැස්වීම පවත්වන ලද අතර මෙහිදි පහත සඳහන් තීරණ ගන්නා ලදී.




i) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්, ඩෙංගු රෝගය මර්ධනය කිරීමට Wolbachia බැක්ටීරියාව ආසාදිත මදුරුවන් ( *Aedes aegypti* ) හඳුන්වාදීමට නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටත් ඊට සමගාමීව ඉන් ඇතිවිය හැකි පාරිසරික අවධානම පිළිබඳ තක්සේරු කිරීම අවශ්‍ය බවටත් තීරණය විය.

ii) රටේ සංවර්ධන කටයුතු සඳහා ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් ගල් වැලි ආනයනයේදී රෝග බෝකරන ජීවීන් පිළිබඳව, විනාශකාරී අපද්‍රව්‍යයන්, විකිරණ කාරක ද්‍රව්‍ය නොපවතින බවට සහතික කරමින් තත්ත්ව සහතිකයක් ද්‍රව්‍ය ලබාදෙන රටෙන් ලබාගතයුතු බවටත් ඇතුළුවීමට පෙර රට තුළදී පරීක්ෂා කර ඉහත ද්‍රව්‍ය නොමැති බවට සහතිකයක් ලබාගැනීම අත්‍යවශ්‍ය බව.

iii) රටකින් රටකට ජෛව සම්පත් හුවමාරු කිරීමේදී සිදුවන ජෛව මං කොල්ලය, ජාන මංකොල්ලය වැනි අහිතකර ප්‍රතිවිපාක වලකාලීම සඳහා ජෛව සම්පත් අපනයනයේදී ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය

මගින් සකසා ඇති ගිවිසුම අනුව (Material Transfer Agreements) භාවිතා කිරීමට අදාළව, අදාල ආයතන කටයුතු කිරීමේ වැදගත්කම,

iv) රබර් වගාවන් ඔයිල් පාම් වගාවන්ට හැරවීම සඳහා යෝජිතව ඇති බැවින් මෙහිදී භූගත ජලය කෙරෙහි ඇතිවිය හැකි බලපෑම් පිළිබඳ විද්‍යාත්මක පසුබිම විස්තරාත්මකව අධ්‍යයනය කර අවසන් තීරණයකට එළඹිය යුතු බව යන විෂය කරුණු රාශියක් පිළිබඳ තීරණ ගනු ලැබීය.

5) **ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප සංරක්ෂණය සහ දේශගුණ විපර්යාස වලට ජනයා අනුගත කිරීමේ ව්‍යාපෘතියේ තෙදින වැඩමුළුව**

ඉහත ව්‍යාපෘතිය මගින් තිරසාර ලෙස අස්වනු නෙලීමේ මාර්ගෝපදේශය සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කරන ලද ප්‍රයෝගික කළමණාකරණයන් හඳුනාගැනීම සඳහා තෙදින වැඩමුළුවක් 2017 සැප්තැම්බර් 28, 29 සහ 30 යන දිනයන්හි හොරණ නේචර් ලවර්ස් ඉන් හිදී පවත්වන ලදී.

මෙම වැඩමුළුව සඳහා මිල්ලනිය , උඩුකුඹුර සහ ගම්පොළ කෘෂි ව්‍යාපෘති බිම් තුනෙහි ගොවි මහතුන් සහභාගිවිය. ගොවිමහතුන් සඳහා ප්‍රායෝගික පුහුණුවීම්, දැනට භාවිතා කරන තිරසාර නොවන අස්වනු නෙළිමේ ක්‍රමවේදයන් හඳුනාගැනීම, තිරසාර නෙළීමේ ක්‍රමවේදයන් සඳහා මාර්ගෝපදේශකත්වය පිළියෙල කිරීම යන මූලික අරමුණු මුල්කරගනිමින් මෙම වැඩමුළුව සංවිධානය විය.

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය මගින් පාරම්පරික වටිනාකමක් ඇති බීජ සංරක්ෂණය කිරීම, සුදුසු බීජ විශේෂ බෙදා හැරීමට එකඟ වූ අතර , ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ඉහළ ආර්ථික වටිනාකමක් ඇති දේශිය ශාක විශේෂයක් වන ඉරිවේරිය ඖෂධීය පැළ ලබාදීම මෙන්ම ව්‍යාපෘති භූමි වලින් තෝරාගත් ගොවි මහතුන් 10ක් සඳහා කිරි එළදෙනුන් 10 ක් ලබාදීම සඳහා ව්‍යාපෘතියට සම්බන්ධ පේරාදෙණිය පශු සම්පත් පීඨය විසින් එකඟතාවය පළ කරන ලදී.